# ටොමීට පාඩමක්



හිමාෂි ආදිත්‍යා හාල්යාල

# ටොමීට පාඩමක්

## හිමාෂි ආදිත්‍යා හාල්යාල


කතාව හා චිත්‍ර - හිමාෂි ආදිත්‍යා හාල්යාල

ISBN - 978-624-206-801-5

දිනය - 2023-11-15

# පිදුම

මාගේ නැණ පහන් දැල්වූ

ගුරු මෑණිවරුන්ට හා පියවරුන්

වෙත

ගෞරවයෙන් පුදමි

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත්  බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින්  ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු  පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින්  "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා  සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023    10    20



ටොමී කියලා පුංචි බලු පැටියෙක් හිටියා. එයාගේ හොඳ ම යාළුවා කිටී කියලා පූස් පැටියෙක්. එයාලා දෙන්න ම හිටියේ සඳුනි කියලා පුංචි ගෑනු ළමයෙක්ගේ ගෙදර.



දවසක් ටොමීට බඩගිනි වෙලා කුස්සියට ගියා. එදා සඳුනිගේ අම්මාට කෑම හදන්න පරක්කු වෙලා.

ටොමී කුස්සියට යනකොට සඳුනියි කිටීයි දෙන්න ටමත් බඩගිනි වෙලා කුස්සියට ඇවිත් හිටියා.

දැන් නම් යාළුවෝ තුන්දෙනාටම හරි ම බඩගිනියි.

ටොමී කීවා කෑම හදනතුරු සෙල්ලම් කරමු කියලා. එයාලා හැමදාම සෙල්ලම් කලේ පහළ වෙලේ පොකුණ ළඟ.



ඒකේ මාළුවෝ පිරිලා. එයාලා මාළුවෝ බල බල පොකුණ වටේ ගියා.

ටොමීට කේක් සුවඳක් ආවා. ලොකු කේක් කෑල්ලක් ඈතින් තිබුණා.

ටොමීට යාළුවෝ අමතක වුණා. එක පිම්මට කේක් කෑල්ලත් අරගෙන ගෙදරට යන්න දිවුවා.



එයා කලබලෙන් එනකොට පාරේ කෙසෙල් ලෙල්ලක් තිබිලා එයාව ලිස්සලා වැටුණා.

ටොමීගෙ කටේ තිබුණ කේක් කෑල්ල විසිවෙලා පඳුරක් අස්සට වැටුණා. ටොමීට ඒ පඳුර අස්සට රිංගන්න බෑ. ඒ පඳුර ගොඩක් පුංචියි.

කිටීට විතරයි එතනට රිංගන්න පුළුවන්. ටොමී කලින්ම හිතුවා කිටීට මොනවත් දෙන්නේ නෑ කියලා. ඒත් කිටී එයා පස්සෙන් ඇවිත් හිටියා.




ඔයාට මම මේක අරන් දෙන්නම්. හැබැයි ඔයා මට මේකෙන් බාගයක් දෙන්න ඕනේ. කිටී කිව්වා.

හොඳයි අපි බෙදාගමු කීව ටොමී ඒකට කැමති වුණා.



කිටී අමාරුවෙන් පඳුර ඇතුලට රිංගලා කේක් කෑල්ල අරන් දුන්නත්, ටොමීට පොරොන්දුව අමතක වුණා.

ටොමී ඉක්මනින් ගෙදරට දුවගෙන ගිහින් තනියම කෑවා.

කිටී දුකෙන් කුස්සියට ගියා.

මේ සිද්ධවුණ හැම දේම සඳුනිත් බලාගෙනයි හිටියේ. එයාට කිටී ගැන දුක හිතුණා.

ඒ වෙනකොට අම්මා එයාලා වැඩියෙන්ම කැමති කෑමක් වු බටර් කේක් සාදා තිබුණා. සඳුනි කිටීට ඉක්මනින් ලොකු කෑල්ලක් බෙදා දුන්නා.





ටොමී එයාට දුන්නේ නැති වුණාට කිටී එයාගෙ කේක් කෑල්ලෙන් ටිකක් ටොමීට දුන්නා.

' දැක්ක ද ටොමී, කිටී කොච්චර හොඳ ද? සදුනි කීවා.

ටොමී ට තමා ගැන ලැජ්ජා හිතුණා. එයා එදා ඉඳන් කෑම බෙදාහදා ගෙන කන්න හිතා ගත්තා.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20